1980

පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මංඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

LIBRARY NEWS

நூலக செய்தி

පාඨක ඔබට ඇරයුමක්!

මෙම කලාපයේ සිට නව මුහුනුවරකින් ඔබ අතට පත් වන පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනයේ පල කිරීම සඳහා ඔබේ අදහස්, ලිපි, පුවත් විමසුමසඳහා අලුත් පොත්පත් යොමු කරන ලෙස ඇරයුම් කරමු.

-සංස්කාරක

1980 ★ පළමුවෙනි කාණ්ඩය ★ අංක 1 Volume No 1 No. 1 1980

ලොව දැනුම එක්තැන් කරන මහ පොත් ගුලක්

අගනුවර ඉදිවෙයි

ඕනෑම විෂයක් පිළිබඳව මෙරට හා ලෝකයේ වෙනත් ඕනෑම රටක ප්‍රකාශිත සියලුම පොත් පත් විදේශීය රටවලට නොගොස් ශ්‍රී ලංකාව තුලදීම කියවීමට හේතුවීම ජනතාවට අවස්ථාව ලබාදෙන ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාතික මට්ටමේ මහ පුස්තකාලය කොළඹ නිදහස් චතුරශ්‍රය අසළ භූමි භාගයක ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් මේ දිනවල ඉදිකර ගෙන යයි.

ජාතියේ විශිෂ්ඨතම බද විශේෂඥ මයිකල් ග්‍රන්ථ සම්භාරය රැස්කර බ්‍රෝන් සහ රජයේ ගෘහ තැබෙන මෙම ජාතික පුස් නිර්මාණ ශිල්පි පානී තෙන් තකාලය ග්‍රන්ථ විද්‍යාත්මක නකෝන් යන මහත්වරුන් තොරතුරු සේවා කාර්යාං විසින් නිර්මාණය කර ඇති ශයකින්, පර්යේෂණ මධ්‍ය සැලස්මක් අනුව දේශීය ස්ථානයකින් සහ අන්තර් ගෘහ නිර්මාණ ශිල්පයට ජාතික ශාස්ත්‍රීය තොරතුරු අනුව මෙම ජාතික පුස්ත හුවමාරු සේවා මධ්‍යස්ථා කාලය ඉදිවෙයි. නයකින්ද සමන්විත වෙයි. මෙම ජාතික මහා පුස්ත ජාතික පුස්තකාල සැලැස්ම පිළිබඳව පුස්තකාල කාලය පිහිටුවීමෙන් පසු ප්‍රවෘත්ති සම්භ පැවැත්වූ එය දිවයිනේ ඇති මහජන සාකච්ඡාවකදී මේ සම්බන්ධව වැඩි දුරටත් විස්තර පුස්තකාල, පාසල්, රාජ්‍ය කළ ජාතික පුස්තකාල දෙපාර්තමේන්තු හා සංස්ථා සේවා අධ්‍යක්ෂක, ඇන්. සහ අනෙකුත් අංශ වලට අමරසිංහ මහතා රටක සනාතන සෞභාග්‍යයක් ඇති සම්බන්ධ සියලුම පුස්ත වන්නේ සදාචාර බුද්ධිමත් කාල සමග සේවා සම්බන්ධීකරණයක් ක්‍රියාශීලී ජන සම්පත් වර්ධනය ඇති කරෙන අතර එමඟින් පර්යේෂකයින්ට මෙන්ම දිවයිනේ දුෂ්කර ගම්බද ප්‍රදේශ වල වෙසෙන පාඨකයින්ට පවා කියවීමට අවශ්‍ය කරන එහෙත් තම ගම් ප්‍රදේශ වල පිහිටි පුස්තකාලවල නොමැති පොත පත එම පුස්තකාල මාර්ගයෙන් මෙම ජාතික පුස්තකාල යෙන් ලබාගැනීමටද කට යුතු සැලසෙයි.

රජය විසින් යුනෙස්කෝ ආයතනයේදඅධාර ඇතිව අන්තර් ජාතික පුස්තකාල ගොඩනැගිලි සැලසුම් පිළි

ජාතික පුස්තකාල සැලැස්ම පිළිබඳව පුස්තකාල ප්‍රවෘත්ති සම්භ පැවැත්වූ සාකච්ඡාවකදී මේ සම්බන්ධව වැඩි දුරටත් විස්තර කළ ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂක, ඇන්. අමරසිංහ මහතා රටක සනාතන සෞභාග්‍යයක් ඇති වන්නේ සදාචාර බුද්ධිමත් ක්‍රියාශීලී ජන සම්පත් වර්ධනය කිරීමෙනැයිද ජාතික පුස්තකාලයක් එම සංවර්ධනය සඳහා අවශ්‍ය සියළු සම්පත් රැස් කිරීම රැක ගැනීම මහජනතාවට ලබා දෙන භාණ්ඩාගාරයක් යැයි ද ජන සම්මත සංවර්ධනය සඳහා හැකි සෑම අයුරින්ම සේවය කිරීම ජාතික පුස්ත කාලයක අපේක්ෂාව බවද සඳහන් කළේය.

පොත් පත් පමණක් නොව සංගීත තැටි, ඡායා රූප ශබ්ද පටි, සිතියම්

(4 වන පිටුවට)

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය-කොළඹ

ජාතික පුස්තකාලය ඉදිවීමෙන් පසු දිස්වෙන අයුරු

පාසල් සිසුනට ජංගම පුස්තකාල

දිවයිනේ විධිමත් පරිදි පුස්තකාල සේවා පහසුකම් නොමැති පාසල් වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හොඳ පොත පත කියවීමට පහසුකම් සලසා දීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ජංගම පාසල් පුස්තකාල සේවා නව වැඩ සටහනක් ක්‍රියාත්මක කර ගෙන යයි.

ඉකුත් ද මැද භාගයේ සිට කොළඹ සහ කෝට්ටේ ආසන වල නිසි පුස්තකාල පහසුකම් නොතිබූ පාසල් ගණනාවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නියමිත පොත් සංඛ්‍යාව බැගින් ඉල්ලා ගැනීමේ ක්‍රමයක් යටතේ එම පාසැල් වලට ගොස් බෙදා දීමෙන් මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබිණි.

(3 වන පිටුවට)

ජනපති අතින් පොත්ගුලට මුල් ගල්

රාජකිය ආසියාතික සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ නව පුස්තකාල ගොඩනැගිල්ලට මුල්ගල තැබීම ජනාධිපති ජේ ආර්. ජයවර්ධන මහතා අතින් ඉකුත්ද කොළඹදී සිදුකෙරිණි.

රන්පලි පොත් බෙදයි

රන්පලි පොත් ආධාර ක්‍රමය යටතේ එක්සත් රාජධානියෙන් ඉකුත්ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙත ලැබුණු පොත් තොග දිවයිනේ විවිධ පුස්තකාල වලට පුස්තකාල සේවා මණ්ඩලය මගින් බෙදා හැර තිබේ.

මේම ආධාර ක්‍රමය යටතේ ලැබෙන විදේශීය පොත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙත ලැබෙන ඉල්ලීම් අනුව අදාල ග්‍රන්ථ අවශ්‍යතා ඇති දිවයිනේ පුස්තකාල වලට බෙදා දීමට පියවර ගනු ලැබේ.

සභාපති පණිවිඩය...

පොත පත කියවීම සහ ඒ සඳහා පුස්තකාල ප්‍රයෝජනයට ගැනීම ගැන දැඩි උනන්දුවක් පවතින මේ යුගයේ පොදු ජනතාවට පුස්තකාලයෝපතිවරුනට සහ රජයේ විවිධ අංශවලට මෙම ක්ෂේත්‍රයේ කෙරෙන කටයුතු කඩිනමින් දැනගැනීමට මාර්ගයක් සකස් කිරීම මෙම ප්‍රකාශනයේ මුඛ්‍ය පරමාර්ථයවේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මෙරට ඇති මහජන පුස්තකාල පාසැල් හා වෙනත් පුස්තකාල දියුණු කිරීමට සැලසුම් කරගෙන යන මෙවැනි අවස්ථාවක ඒ පිළිබඳ තොරතුරු විසුරුවා හැරීමටත් මහජනතාවගේ අදහස් ලබා ගැනීමටත් මෙම පුවත් පත උපකාරීවේය යනු මගේ විශ්වාසයයි.

එච්. පී. සිරිවර්ධන
සභාපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

සංගීතයට සවන් දෙන අතරම් එම සංගීතය ස්වර, ගීත පද මාලා ඇතුලත් පොත් කියවීමට නවීන දියුණු පුස්තකාලවල පාඨකයනට පහසුකම් සැලසී තිබේ. මේ නිසාම සංගීතය විෂයක් වශයෙන් හදාරන විශ්ව විද්‍යාල හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද සාමාන්‍ය පාඨකයන්ටද තම විෂය දැනුම ප්‍රගුණ කර ගැනීමට වැඩි පහසුකම් සැලසී තිබේ. මේම ඡායාරූපයෙන් දක්වෙන්නේ බවරිජර්මනියේ පුස්තකාලයක එවන් පහසුකම් ප්‍රයෝජනයට ගන්නා පාඨකයන් කිහිප දෙනෙකි.

උපදෙස් දෙන්න පියවර ගනී.

පුස්තකාල සේවා සංවර්ධනය කිරීම සඳහා විධිමත් පියවර ගැනීමේ අරමුණින් පුස්තකාල ක්ෂේත්‍රයේ නියුතු පාලන නිලධාරීන්ට වෘත්තිය හා තාක්ෂණික උපදෙස් කඩිනමින් ලබාදීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පියවර ගෙන තිබේ.

ඉකුත් වර්ෂයක කාලතුලදී මේ යටතේ දිවයිනේ මහජන පුස්තකාල 22 කටත් පාසල් පුස්තකාල 4 කට සහ දෙපාර්තමේන්තු පුස්තකාල 7 කටත් මෙම උපදෙස් ලබාදී ඇත.

ළමා මනස සහ පොත පත

ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් වැනි ජනසංනිවේදන මාධ්‍යයන් දියුණුවී ඇති මෙම ශත වර්ෂයේ දැනුම වර්ධනයේලා පොත්පත්වලට ඇති වැදගත්කමත් රටට වැඩදායී වැදගත් පුරවැසියන් බිහිකිරීම සඳහා ළමා පරපුර පොත් පත් කියවීමට යොමු කිරීමේ අවශ්‍යතාවයත් එය කළ හැකි අන්දමත් පෙන්වා දෙන පර්යේෂණාත්මක ලිපි පෙළක පළමුවැන්න මෙය වෙයි. ළමුන් තුළ පොත් පත් කියවීමට ඇති හැකියාවන් වර්ධනය කිරීම පිළිබඳව කරුණු අද මෙම ලියුම්කරු පෙන්වාදෙයි.

''බාල වියෙහිදීම උගත යුතුය. නිසි කලට වපුරා ගත යුතුය. නොවීල්ලේ පුරුද්ද සොහොන දක්වා යයි...'' වැනි ආප්තෝපදේශ බාල වීය පිළිබඳ ඉතා පුදුමාකාර හැකියාවන් පැහැදිලි කරවයි.

ළදරුවකුගේ සිත ඉතා පිරිසිදුය, නිර්මලය. එහි කිසිදු පළුද්දක් නොමැත. ළදරු සිතට හසුවන අත්දැකීම් නිර්මලව කාවැදී යයි. ඇතැම් උගත්තු තමන්ගේ බාල විය සිය ජීවිත හැඩ ගස්වා ගැනීමට තුඩු දුන් ආකාරය අපට පැහැදිලි කරති. බාල වියේදී අප සිත්වල නිර්මල සිතිවිලි ප්‍රතිෂ්ඨාපනය වීමට හැකියාවක් ඇති හෙයින්, එම වියේදීම යහ පත් ගති ගුණවලට බාලයන් ව මෙහෙයවීමේ අත්‍යවශ්‍යතාව බව කහවුරුවේ.

මේ සම්බන්ධයෙන් බලන කල, දරුවකුගේ අනාගත යහපත් මානසික වර්ධනයට තුඩු දෙන පොත්පත් කියවීමේ පුරුද්ද දැඩි ලෙස බලපාන බව පෙනී යයි.

පොත් පත් කියවීම දැනුම වර්ධනයේදී මුල්තැන් ගන්නා දෙයකි. පුවත් පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි ජනප්‍රිය ජනසන්නිවේදන මාධ්‍යයන් දියුණු වී ඇති මෙම 20 වන ශත වර්ෂයේ පවා දැනුම වර්ධනයේ ලා පොත් පත්වලට ඇති වැදගත්කම නො අඩුව පවතී. දැනුම වර්ධනයේ ප්‍රධානතම මාධ්‍ය වී ඇත්තේ පොත පතය. කෙනෙකු තුළ ඇති ස්වීය හැකියාවන්, පාලන දක්ෂතාවන් පෝෂණය කිරීමට පොතපතට ඇති හැකියාවට සමාන හැකියාවක් ඇති අන් කිසි මාධ්‍යයක් නැතැයි වර්තමානයේ අත්දැකීම් අනුසාරයෙන් දත හැකිය.

බොහෝ ජන මාධ්‍යයන් හේතුකොට ගෙන ජනයාගේ ස්වීයත්වයද, පාලන ශක්තියද පිරිහී යන බව ඒකාධිපති පාලන ක්‍රමයන් ඇති රටවල අත්දැකීම් තුළින් පෙනී යයි, ප්‍රජාතාන්ත්‍රික පාලන ක්‍රමයක් ඇති රටවලද ජන මාධ්‍යයන්ගේ ප්‍රබලතාව නැතැයි කිව නොහැකිය. අද සිනමාව මා මෙතෙක් කී කරුණුවලට සාක්ෂි ලෙස ගත හැක.

පොතින් ලැබෙන අනුබලය:

බාලයන් තුළ පොත පත නිසා ඇතිවන වෙනස්කම් පිළිබඳව රිවඩ බැම්බර්ගර් ශෙ සේ විස්තර කරයි: ''බාලයකු වර්ධනය වීමේදී පොතපතින් ලැබෙන අනුබලය සර්වාවරය.'' ඔහුගේ මතය නම් ගොඩනැගිල්ල නිර්මානය කරන්නාවූ ගඩොල් වන්නේ පොත පතය. පොත පත කෙනෙකුගේ කල්පනා ශක්තිය වර්ධනය කොට මනස සකස් කරයි. තවද පොතපත බාලයන්ගේ සහ ගැටවරයන්ගේ දැනීම පෝෂණය කරවා, ඔවුන්ගේ ජීවිත ප්‍රශ්න විසඳා ගන්නට උපකාරීවේ.

මහාර්ඝ පල ලද හැකි පොතපත කියවීමේ අවස්ථාවක් අප තුළින් හා අපගේ දරුවන් තුළින් ගිලිහී යාමට ඉඩ දිය හැකිද? අපගේ යුතුකම වන්නේ බාලයන් හා පොතපත අතර ඇති සම්බන්ධතාවය වර්ධනය කිරීමට කටයුතු කිරීමයි.

බාලයන්ගේ පොත පත කියවීමේ නැඹුරුව පිළිබඳ සලකා බලමු. වැඩිවිය පත් වූවන් පොත පත කියවීමට නැඹුරුවීමේ විවිධාකාර හේතු ඇතත්, අප කල්පනා කළ යුත්තේ බාලයන් මෙසේ නැඹුරුවීමට ඇති හේතූන්ය. මේ දෙපාර්ශවය අතර පොත පත කියවීමේ මූලික වෙනස මුල දීම අපට පැහැදිලිකර කර ගත යුතුය.

තමා කියවන දෙය තෝරා ගැනීමේ හැකියාව වැඩිහිටිය නට ඇත. තවද විෂයයන් පිළිබඳ සිය රුචි අරුචිකමද කියවීම කෙරෙහි බලපායි. බොහෝ දෙනෙකුගේ ස්වීයත්වය තමා කියවන්නාවූ විෂයය කෙරෙහි අවධානය තර කරයි. ඒ නිසාම ඔවුන් කියවීමේදී තෝරා-බේරාගෙන කියවීමට දනී. එහෙත් බාලයන්ගේ තත්වය මෙයට වඩා වෙනස්වෙයි.

(තවත් කොටසක් ලබන කලාපයේ පළවෙයි.)

සහකාර පුස්තකාල සේවා අධ්‍යක්ෂක
● එස්. එම්. කමල්දීන් විසිනි

අපේ පුස්තකාලය

වේයන්ගොඩ මහජන පුස්තකාලය



අලුතින් ඉදිවුන පුස්තකාලය

අපේ පුස්තකාලය නව විශේෂාංගය යටතේ අද ඔබට හාපුරා කියා විස්තර කරන්නේ වේයන්ගොඩ මහජන පුස්තකාලය පිළිබඳවයි.

සියනෑ කෝරළයේ ජනාකීර්ණ ප්‍රධාන නගරයක් වන වේයන්ගොඩ නගරය මධ්‍යයේ ඇති වේයන්ගොඩ සුළු නගර සභා කාර්යාලයට යාබද ගොඩනැගිල්ලක පිහිටි මෙම පුස්තකාලය 1959 අප්‍රියෙල් මස 9 වෙනි දින ආරම්භ කරනු ලැබිණි.

අවට ප්‍රදේශවල පිහිටි පුස්තකාල ගණනාවකට අන්තර් පුස්තකාල සේවය යටතේ තෙමසකට වරක් පොත් හුවමාරු කර බෙදහරින මධ්‍ය පුස්තකාලයක් වශයෙන්ද වේයන්ගොඩ මහජන පුස්තකාලයෙන් පාඨක සේවා සැපයෙයි.

පසුගියද පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රුපියල් 10,000 ක ආධාර මුදලක් යටතේ මෙම පුස්තකාලයට අමතර අලුත් පොත් මිළදී ගැනීම වද දැනටමත් අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

ඉකුත් මාසය වන විට 540 ක් පමණ සාමාජික සංඛ්‍යාවක් සිටී මෙම පුස්තකාලයෙන් දැනට ග්‍රන්ථ 3000 ක පමණ සංඛ්‍යාවක්ද ඊට අමතරව එදිනෙදා පළවන වාර සඟරා, ප්‍රවෘත්ති ප්‍රකාශන ආදියද පාඨකයන්ට කියවීමට පහසුකම් සැලසී තිබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන්ද මෙම පුස්තකාලයට පොත් සහ අනෙකුත් සේවා ආධාර ලබා දෙන බවද පාඨකයන්ගෙන් ලැබෙන ක්‍රියාශීලී සහයෝගය පුස්තකාලය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට විශාල රුකුලක් වී ඇතැයි එහි පුස්තකාලයාධිපති එච්. ගුණතිලක මහතා පුස්තකාල ප්‍රවෘත්ති සමග පැවැත්වූ පිළිසඳරකදී පැවසීය.

මේ අතර මෙම මහජන පුස්තකාලය වැඩි දියුණු කිරීම සඳහා අගමැති ආර්. ප්‍රේමදාස මැතිතුමා යටතේ ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විශාල සේවයක් දැනටමත් ඉටු වී ඇත.

විශේෂයෙන් කාලයක් මුළුල්ලේ අතරමහ ඇතිව තිබූ නව පුස්තකාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුද කඩිනමින් ආරම්භකර දැන් එහි ඉදිකිරීමේ කටයුතු පවා සම්පූර්ණ යෙන් නිම කිරීමට මේ නිසා හැකි වී තිබේ.

වේයන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට අංග සම්පූර්ණ පුස්තකාලයකට ගොස් පොත් පත් කියවීමට ඒ තුළින් අවස්ථාව ලැබෙන බව වේයන්ගොඩ සුළු නගර සභාවේ විශේෂ කොමසාරිස් ජී. එච්. බී. ද සිල්වා මහතා පුස්තකාල ප්‍රවෘත්තියට ප්‍රකාශ කළේය.

වේයන්ගොඩ නව මහජන පුස්තකාලයේ ළමා පරපුර සඳහා විශේෂ ළමා අංශයක්ද අනෙකුත් පුස්තකාල සේවා සියලුම අංශයන්ගෙන්ද සමන්විතවෙයි.

සකස් කලේ-
බන්දුල නාරද නිශ්ශංක

ජාතික ග්‍රන්ථ නාමාවලියට ප්‍රකාශන එවන්න

ශ්‍රී ලංකාවේ පළවන සියලුම පොත්පත් හා විදේශීය රටවල ලංකාවට අදාල මාතෘකා පදනම් කොටගෙන පළවන පොත්පත් පිළිබඳව තොරතුරු ඇතුළත්කර මුද්‍රණය කෙරෙන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ පළකිරීම් සඳහා එදිනෙදා පළවන පොතපත පිළිබඳව හා පැරණි පොත් පත් පිළිබඳවද තොරතුරු දන්වන ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ඉල්ලීමක් කරයි.

ත්‍රෛමාසික ප්‍රකාශනයක් වශයෙන් ප්‍රකාශයට පත්වෙන මෙම ජාතික ග්‍රන්ථ නාමාවලියේ 1962 සිට නොකඩවා පළකර ඇති අතර මෙරට මුද්‍රණ ශිල්පය ආරම්භවූ දා පටන්, එනම් 1937 සිට 1962 දක්වා කාලය තුල පළවූ පොත් පිළිබඳවද විස්තර ඇතුළත් කර සම්පූර්ණ ග්‍රන්ථ කෝෂයක් ලෙස පළකිරීමට බලාපොරොත්තු වේ.

අදාල විෂය සිරස්තල යටතේ පොත් පත්වල නම් සමඟ එම ග්‍රන්ථ කර්තෘවරුන් හෝ සංස්කාරක වරුන්ගේ නම් මුද්‍රණ ශිල්පීන් හා ප්‍රකාශක ආයතනවල නම්ද පළ කළ වර්ෂය, පොතේ ප්‍රමාණය මිළ යනාදී විස්තරද ඇතුළත්ව සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් මෙම ජාතික ග්‍රන්ථනාමාවලිය දැන් මුද්‍රණය කෙරෙයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට ලැබෙන පොත්පත් විස්තරද මුද්‍රණ ශිල්පීන්ගේ ගා ප්‍රකාශකයන්ගේ ආඥා පනතේ අංක 6 දරණ සංශෝධනය යටතේ ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් හා ප්‍රවෘත්ති පත්‍ර ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන්ද පුස්තකාල සේවා මණ්ඩලය වෙත ලැබෙන පොත්පත් විස්තරද මෙම ග්‍රන්ථ නාමවලියේ සඳහන් කෙරෙයි.

මෙම ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශනයේ පළකිරීම සඳහා පැරණි හා අලුත් පොත් පත්වල පිටපත බැගින් හෝ ලැබෙන්නට සලස්වන ලෙස ග්‍රන්ථ කර්තෘවරුන් සංස්කාරක වරුන් හා ප්‍රකාශකයන්ගෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය කාරුණික ඉල්ලීමක් කරයි.

එම් පොත්පත් පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂක ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, තුන්වන මහල, නව මහලේකම් කාර්යාලය, කොළඹ 10; යන ලිපිනයට යොමු කළ යුතු වෙයි.

පුස්තකාල විද්‍යා පාඨමාලා විමර්ශනය කෙරේ

ලංකාවේ විවිධ අධ්‍යාපනික හා වෘත්තීය ආයතනවලින් පසුවිපස ලබන පුස්තකාල විද්‍යා පාඨමාලාවල වෘත්තීයමය තත්වය ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පරීක්ෂණයට භාජනය වී ඇත.

පුස්තකාල විද්‍යා පාඨමාලා විමර්ශනයට ලක් කිරීම සඳහා පත්කරන ලද විශේෂ කමිටුවක් විසින් දැනටමත් කැළණිය විශ්ව විද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව පිළිබඳ සිය වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කොට තිබේ.

දැනට අවුරුදු කිහිපයක සිට පුස්තකාල විද්‍යා පාඨමාලා හදාරා පුස්තකාල ක්ෂේත්‍රයට පිවිසෙන පුස්තකාලයාධිපතීන් ගේ වෘත්තීය දැනුම හා දක්ෂතා පිළිබඳව විවිධ දෙපාර්තමේන්තු ආයතන හා ප්‍රධාන පුස්තකාලයාධිපති වරුන් විසින් සිය අපේක්ෂා හංගන්වය පළකොට මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම පියවර ගෙන ඇත.

ලංකාවේ පුස්තකාල විද්‍යා පාඨමාලා පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා කැළණිය විශ්ව විද්‍යාලය මගිනි.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පණතයටමත් පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පිළිගැනීම පිළිබඳව රජයට උපදෙස් දීම ජාතික පුස්තකාල සේවා මණ්ඩලයව පැවරී ඇති වගකීමකි.

ජ්. ඩබ්. පෙරේරා ලිපි ජාතික පුස්තකාලයේ තැන්පත් වේ

1915 ලංකාවේ පැවති සිංහල - මුස්ලිම් අරගලය හේතුකොට ගෙන ඇති වූ ජාතික සටන සම්බන්ධයෙන් එවකට ලංකාවේ විසූ ප්‍රවීණ දෙශ ප්‍රේමියකු වූ ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා විසින් බ්‍රිතාන්‍ය රජය විසින් මෙම අරගලය මර්දනය කිරීමේදී කරන ලද අසාධාරණකම් හා ලංකාවට ස්වාධීනත්වය ලබා ගැනීමේ අවශ්‍යතාවය දක්වමින් තමා විසින් එංගලන්තයේ හා ලංකාවේ ගෙන ගිය දේශපාලන ව්‍යාපාරයට සම්බන්ධව ලියුම් කියුම් රාශියක් ජාතික පුස්තකාලයට ලැබී තිබේ.

මෙම වටිනා ලේඛන තොගය ජාතික පුස්තකාලයට තැගි කරන ලද්දේ මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා විසිනි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ප්‍රතිසංවිධානයට විශේෂයෙක්

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඕස්ට්‍රේලියාවේ CSIRO ආයතනයේ පුස්තකාලයාධිපති පී ජිඩර් රසල් මහතා ලංකාවට පැමිණ සිටී. පීටර් රසල් මහතා ඕස්ට්‍රේලියාවේ විශාලතම විශේෂ පුස්තකාලයේ පුස්තකාලයාධිපති වරයායි.

ලංකාවේ කෘෂිකර්ම හා තදාසන්න විෂයයන් පිළිබඳ ඉතාම විශාල පුස්තකාලය වන පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු පුස්තකාලය පරිගණීකරණ පුස්තකාලයක් වශයෙන් සංවිධානය කළයුතු බව ජාතික පුස්තකාල මණ්ඩලය විසින් කරන ලද පරීක්ෂණයකින් අනතුරු එහි අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙන ලදී. මේ සම්බන්ධයෙන් සවිස්තර වැර්තාවක් ඉදිරිපත් කළ මණ්ඩලය පළපුරුදු පුස්තකාලයාධිපති වරයකුගේ මාර්ගෝපදේශකත්වය යටතේ පුස්තකාල ප්‍රතිසංවිධානය කිරීමත්, දැනට ඇති කාර්ය මණ්ඩලය නූතන විශේෂ පුස්තකාල සේවා පිළිබඳ පුහුණුවක් ලබාදිය යුතු බවත් නිර්දේශ කරන ලදී.

පීටර් රසල් මහතා මේ සම්බන්ධයෙන් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය ප්‍රකාශන ග්‍රන්ථ නාමාවලියක්

ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ සමාජ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය මගින් ශ්‍රී ලංකාවේ මේන්ම, විදේශයන් හිදී ශ්‍රී ලංකාවේ වෛද්‍ය පර්යේෂණ අරභයා දැලව් ඇති ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් තොඛෝද ප්‍රකාශයට පත් කර ඇත.

කාමලිකා පිරිස් මහත්මිය සහ සී. ජේ. ඌරගොඩ විසින් සම්පාදනය කර ඇති මෙම ග්‍රන්ථ නාමාවලිය සංලේඛ 4,500 කින් සමන්විතය.

ශ්‍රී ලංකා සිතියම් සූචියක්

නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි රාජ්‍ය ලේඛනාගාරයේ ඇති ශ්‍රී ලංකා සිතියම් පිළිබඳ සූචියක් දැන් සැකසෙමින් පවතින බව වාර්තා වේ.

මෙම ලේඛනය ප්‍රාදේශීය නාම අනුව වර්ග කර දක්වා ඇත. එමෙන් 1796 සිට 1638 දක්වා පිළියෙල කළ සිතියම් 302 ක පමණ විමර්ශනා අඩංගු කර ඇති බව දක්වේ.

මෙම සූචිය සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරයේ සහකාර ලේඛනාරක්ෂක ජේ. ඩී. පරණවිතාන මහතා විසිනි.

දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේ ඡායාරූප වැඩසටහන

(ඩී. ගල්ප්පත්ති විසිනි)



දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන් අමතා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ මහතා කතා කළ අවස්ථාවයි මේ. වේදිකාවේ අසුන්ගෙන සිටින්නේ (පිළිවෙලින් වමේ සිට) ආසියා පදනමේ දේශීය නියෝජික ප්‍රෑන්ක් ඊ. ඩයින්ස්, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රා ද සොයිසා, ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ ආචාර්ය ඩී. වීසුම්පෙරුම, පුස්තකාල සේවා මණ්ඩල සභාපති එම්. ජේ. පෙරේරා සහ අධ්‍යාපන සේවා අමාත්‍යාංශ ගරු ලයනල් ජයතිලක යන මහත්වරුය.



ස්ත්‍රික් පුස්තකාල සම්මන්ත්‍රණය සංවිධානය භාරව කටයුතු කළ පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ උපාලි අමරසිරි මහතා අධ්‍යාපන සේවා අමාත්‍යතුමාට පාඨමාලාවට අදළ කරුණක් විස්තර කර දෙයි.



දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේ පසුබිම් දේශණය පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන මහතා විසින් පවත්වන ලද ආකාරය මෙහි දැක්වෙයි. මුලසුනේ සිටින්නේ පුස්තකාල සේවා මණ්ඩල සභාපති එම්. ජේ. පෙරේරා මහතාය.

දිස්ත්‍රික්ක පුස්තකාල සංවර්ධන සැලැස්ම

ජාතික මට්ටමින් මහජන පුස්තකාල සේවයක් ඇරඹීම සඳහා දිස්ත්‍රික්ක පුස්තකාල ක්‍රමයක් ඇරඹීමේ අවශ්‍යතාවය ගැන යෝජනා ඉදිරිපත් වන්ට වූයේ දැනට අවුරුදු 20කටත් පෙරය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා පිළිබඳ සහකාර අධ්‍යක්ෂ
එස්. එම්. කමල්දීන්
විසිනි

ඇත්ත වශයෙන්ම දිස්ත්‍රික් පුස්තකාල ක්‍රමයක් ගැන සලකා බලන ලද්දේ ලංකාවේ පැවති පළාත් පාලන ආයතන ක්‍රමය අනුව පළාත් පාලන ආයතන සංඛ්‍යාව ඉතා වැඩි බැවින් දිස්ත්‍රික්ක මට්ටමේ පළාත් පාලන ක්‍රමයක් ඇති විය යුතුය, යන අපේක්ෂාව මතය. දිස්ත්‍රික් මට්ටමේ පළාත් පාලන ආයතන ක්‍රමයක් 'දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල' නමින් හඳුන්වන පළාත් පාලන ක්‍රමය යටතේ ඇති කිරීමට වත්මන් රජය ක්‍රියා කිරීම සතුටට කරුණකි. අනිවාර්යයෙන්ම මේ නිසා දිස්ත්‍රික් මහජන පුස්තකාල ක්‍රමයක් ඇතිවීම නොවැළැක්විය හැක්කකි.

දිස්ත්‍රික්කයක සංවර්ධන කටයුතු දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලයේ විධායක කමිටුව විසින් මෙහෙයවීම රජයේ පරමාර්ථය වේ. එම සංවර්ධන මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ දිස්ත්‍රික් ඇමතිවරයාය. මෙම ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ සියළු දෙනාටම ප්‍රයෝජන ගත හැකි පුස්තකාල ක්‍රමයක් දිස්ත්‍රික් ඇමතිතුමා සහ සංවර්ධන මණ්ඩලය යටතේ බිහිවනු ඇත. එවැනි සංවිධානයක් මගින් දිස්ත්‍රික්කයේ ඇති පුස්තකාල පහසුකම් වලින් උපරිම ප්‍රයෝජනයක් මහජනයාට ලබා ගත හැකි වන අතර, පුස්තකාල ක්ෂේත්‍රයේ ඇති සීමිත සම්පත් වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගැනීමටද හැකිවනවා ඇත. දිස්ත්‍රික් සංවර්ධන ක්‍රමය යටතේ ඇති කාර්ය භාරයට පුස්තකාල සේවා ඇතුළත් නොවී ඇති බව මා මෙහිදී සඳහන් කළ යුතුයි. ඇතැම් විට අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු අතරට පුස්තකාල සංවර්ධන කටයුතුද ඇතුළත්වේ යයි අනුමාන කළ හැක. දිස්ත්‍රික් සංවර්ධනය ක්‍රමය යටතේ අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහන් වී තිබේ. ඒ හැර සිය වැඩ පිළිවෙලට ඇතුළත් නොවී ඇති ඕනෑම විෂයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවකාශය දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරයට ඇතුළත් වී තිබේ. එමනිසා පුස්තකාල සංවර්ධනය පිළිබඳව කටයුතු කෙරෙහි දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලය අවධානය යොමු කරනු ඇතැයි විශ්වාස කළ හැක.

කමිටු නිර්දේශ

1955 පමණ ඇත කාලයේ සිට ජාතික මට්ටමින් ඒකාබද්ධ පුස්තකාල සේවයක් ඇති කිරීමෙහිලා බලධාරීන් අවධානය යොමු කොට තිබේ. පළාත් පාලන ආයතනවල පුස්තකාල සම්බන්ධයෙන් නිර්දේශයක් කළ වෙක්සි කොමිෂන් වාර්තාව මෙසේ සඳහන් කර තිබේ. 'පුස්තකාල සම්බන්ධයෙන් අප අරමුණ විය යුත්තේ ඉතා කුඩා පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක වෙසෙන මහජනයාට වුවද තමාගේ ශාස්ත්‍රීය කටයුතුවලට හෝ සාමාන්‍ය කියවීමට හෝ අවශ්‍ය වන පොත පත තම ගම්සභා පුස්තකාලයට ලබා ගැනීමට නොහැකි නම් වෙනත් පුස්තකාලයකින් අන්තර් පුස්තකාලයීය සහයෝගිතා ක්‍රමයක් යටතේ ලබා ගැනීමට පහසුකම් සැපයීමයි.(සැසි වාර්තා- 32. 1955 පළාත් පාලන ආණ්ඩු ක්‍රමය පිළිබඳ කොමිෂන් වාර්තාව 1958) කන්දයියා කොමිෂන් වාර්තාවේද මෙම අදහසම ප්‍රකාශ කොට තිබේ. එහි සඳහන් කොට ඇත්තේ ජාතික මට්ටමෙන් පුස්තකාල දියුණු කිරීම සඳහා ජාතික පුස්තකාලයක් අවශ්‍ය බවත්, ජාතික පුස්තකාලයේ මූලික සේවාවලට අමතරව වශයෙන් දිප ව්‍යාප්තව පුස්තකාල සේවා සංවිධානය කිරීමේ මධ්‍යස්ථාන වශයෙන් ජාතික පුස්තකාලය කටයුතු කළයුතු බවත්ය. එවැනි මධ්‍යගත සේවයකින් පොත පත ගැන තොරතුරුද, පොත් පත් නොමැහොත් පුස්තකාල සංවිධාන කිරීමේ ක්‍රමයද සැලැස්විය යුතු වන්නේය. (කොළඹ මහජන පුස්තකාලය පිළිබඳ කොමිෂන් වාර්තාව 1958)

1961 දී ලංකාවට පැමිණි පුස්තකාල විශේෂඥ හැරල්ඩ් වී. බොනි විසින්ද 1967 දී කොළඹ පැවති ''ආසියාවේ පුස්තකාල සේවා සැලසුම් කිරීම පිළිබඳ විශේෂඥයින්ගේ සම්මේලනය'' විසින්ද දිස්ත්‍රික්ක මධ්‍ය පුස්තකාල ක්‍රමයක් පිහිට විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

බොනි මහතා යෝජනා කරන ලද්දේ මහජන පුස්තකාල සේවා මණ්ඩලයක් ඇති කිරීමටත්, ඒ යටතේ දිස්ත්‍රික් පුස්තකාල සේවා දිස්ත්‍රික්ක පුස්තකාල සේවා මණ්ඩලද, මෙම දිස්ත්‍රික්ක පුස්තකාල සේවා මණ්ඩල මගින් ඒ ඒ දිස්ත්‍රික්කවල පුස්තකාල සංවිධානය කිරීමටත්ය.

මණ්ඩලයේ කාර්ය

අද තත්වය අනුව, ජාතික පුස්තකාල මණ්ඩලයක් පිහිටුවා ඇති හෙයින් දිස්ත්‍රික්ක පුස්තකාල කටයුතු සංවිධානය කිරීම හා සේවා ඒකාබද්ධ කිරීම මෙම මණ්ඩලයේ කාර්යයක් වීම ස්වභාවිකයි. ලංකාවේ පුස්තකාල සංවර්ධනය පිළිබඳව මධ්‍යම කාර්යාංශය වන්නේ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයයි.

1967 දී පැවැති පුස්තකාල විශේෂඥ සම්මේලනයේ අදහස වූයේද දිස්ත්‍රික්ක පදනමක් යටතේ මහජන පුස්තකාල සංවිධානයක් ඇති කිරීමය. දිස්ත්‍රික්ක පුස්තකාල සම්බන්ධයෙන් එම සම්මේලන වාර්තාවේ මෙසේ සඳහන් වේ.

''ලංකාවේ දිස්ත්‍රික්ක 22 ක් ඇත. මේ හැම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරයේ දිස්ත්‍රික්ක පුස්තකාලයක් පිහිටවනු ඇත. මෙම පුස්තකාලය භාරව කටයුතු කරන පුස්තකාලයාධිපතින් විසින් එම නගරවල පුස්තකාල සේවයක් ඇති කළ යුතු අතර, දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවලද පුස්තකාල පහසුකම් සංවර්ධනය කළ යුතු වේ.''

මෙම වාර්තාවේ නිර්දේශ කොට ඇත්තේ ජාතික මට්ටමින් පුස්තකාල සේවා සංවිධානය හා සැලසුම් කිරීම පිළිබඳ අධිකාරිය ලෙස ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ක්‍රියා කළ යුතු බවත්, ඒ මාර්ගයෙන් මහජන පුස්තකාල සේවාවන් ඒකාබද්ධ කළ යුතු බවත්ය. යථෝක්ත සම්මේලනයට ඉක්බිතිව ලංකාවට පැමිණි යුනෙස්කෝ විශේෂඥ එච්ලින් එවන්ස් මෙනවිය මෙම යෝජනා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක ආකාරයට රජයට පෙන්වා දුන්නාය.

පණතක අවශ්‍යතාව

මේ අවස්ථාවේ මම සඳහන් කරන්නට කැමතියි, ලංකාවේ මහජන පුස්තකාල සංවර්ධනය කිරීමෙහි ලා බොහෝ කාලයක සිට පැවත එන දුෂ්කරතාවයන් දෙකක් ගැන. එනම්, පුස්තකාල සේවාවලට අදාලව රාජ්‍ය පණතක් නොතිබීමත්, මහජන පුස්තකාල පැවැත්වීම/ නොපැවැත්වීම පළාත් පාලන අධිකාරීන්ගේ අභිමතය පරිදි කළ හැක්කක් වීමත්ය. එනිසා ජාතික මට්ටමේ පුස්තකාල සේවයක් ඇති කිරීම සඳහා මහජන පුස්තකාල පණතක ඇති අවශ්‍යතාවයත්, එවැනි පණතක් යටතේ පළාත් පාලන ආයතන මගින් පැවැත්වීම නිතිමය අවශ්‍යතාවයක් කිරීමත් වහාම කළ යුත්තකි.

මේ සම්බන්ධයෙන් අපේ අසල්වැසි රටක් වන ඉන්දියාවේ මදුරාසි ප්‍රාන්තයේ 1948 දී ඇති කළ මහජන පුස්තකාල පණත අපකාගේත් සැලකිල්ලට භාජන විය යුත්තකි. පසුගිය විසිපස් වසර තුළ මදුරාසි ප්‍රාන්තයේ ක්‍රමවත් මහජන පුස්තකාලයක් ගොඩ නැගීමට මෙම පණත ඉතාමත් ප්‍රයෝජනවත් වී ඇත.



දිස්ත්‍රික් පුස්තකාල සැලැස්ම සහ ජාතික පුස්තකාලය හා එය අනුබද්ධ වන ආකාරය ඉහත සටහනෙන් දැක්වේ.

ලංකාවේ මහජන පුස්තකාල සේවයක් ප්‍රතිෂ්ඨාපනය නොවීමට හේතු වූයේ අප බ්‍රිතානය පුස්තකාල සේවා අනුගමනය කිරීම නිසාය. බ්‍රිතාන්‍යයේ පවා 1850 ට පසු මහජන පුස්තකාල සේවා පැවැත්වීම සඳහා නීතිරීති ඇතිවිය. 1964 දී එක්සත් රාජධානියේ සම්මත වූ පුස්තකාල හා කෞතුකාගාර ආඥා පණත යටතේ පළාත් පාලන ආයතන විසින් පුස්තකාල සේවා ආරම්භ කිරීමට අවශ්‍ය සේවාවක් කරන ලදී. මෙම පණතේ විධිවිධානයන් අනුව එංගලන්තයේ හා වේල්සයේ පුස්තකාල සේවා පැවැත්වීම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ලේකම් වරයාගේ වගකීමක් විය.

මා කලින් සඳහන් කළ පරිදි කන්දයියා කොමිෂන් වාර්තාවේත්, 1967 පුස්තකාල විශේෂඥවරුන්ගේ සම්මේලන වාර්තාවේත් නිර්දේශ කොට ඇති අයුරු අනාගතයේදී ලංකාවේ ඒකාබද්ධ මහජන පුස්තකාල සේවයක් සංවිධානය කිරීම සඳහා සකස් කෙරෙන ආඥා පණතක ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා අංශය එම සේවා සංවිධානයේ කේන්ද්‍රස්ථානය ලෙස පිළිගැනීම අවශ්‍යයයි සිතමි.

කුමන රටක වුවත්, ක්‍රමවත් පුස්තකාල සේවයක් සංවිධානය කිරීමේදී පළාත් පාලන ආයතනවල සංඛ්‍යාව, ස්වභාවය ගැන සැලකිලිමත් වීම ඉතා වැදගත් කරුණකි. උදාහරණයක් වශයෙන්, එංගලන්තයේ 1972 දී ඇති කළ පළාත්පාලන ආයතන පණතින් එම රටෙහි තිබූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව 364 සිට 107 දක්වා අඩු කරනු ලැබිණ. මෙසේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව අඩු කිරීම හේතු කොට ගෙන පළාත් පාලන ආයතන වඩාත් ප්‍රබල වී, වඩාත් පළල් සේවා ඇති කිරීමට සමත් විය. පුස්තකාල පැවැත්වීම සඳහා මේ අනුව පළාත් පාලන ආයතන සංඛ්‍යාව කුඩා විය. එසේම ඒ ආයතනවලට සැලකිය යුතු ප්‍රමාණයේ ජනගහනයකට එම සේවා ලබා දීමට හැකි විය. ඒ සඳහා ලැබූ මුදල් ප්‍රමාණයද වැඩි විය. ඒ නිසා විශාල ප්‍රදේශයක පුස්තකාල පහසුකම් සැපයීමටද හැකි විය. එහි ප්‍රතිඵලය වූයේ 1964 පුස්තකාල හා කෞතුකාගාර ආඥා පණත අනුව විධිමත් වූද ව්‍යාප්ත වූද සේවාවන් ඇති කිරීමට හැකි වීමය.

ලංකාවේද දැන් මෙවැනි ප්‍රතිසංවිධානයකින් පළාත් පාලන ආයතන වඩා ක්‍රියාශීලි ආයතන බවට පත් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. දැනට 679 ක් වන පළාත් ආණ්ඩු ආයතන සංඛ්‍යාව 250 දක්වා අඩු කිරීමට යෝජනා කොට ඇත. මුදල් තත්වය අසතුටුදායක, අවශ්‍ය පුහුණු සේවක මණ්ඩලය නොමැති දුර්වල පළාත් පාලන ආයතන වෙනුවට ශක්තිමත් පළාත් පාලන ක්‍රමයක් මෙයින් අනිවාර්යයෙන් ඇති වීම බලාපොරොත්තු විය හැක. ඒ අනුව පුස්තකාල සේවාද වඩා ක්‍රියාශීලී සේවයක් වනු නොඅනුමානය.

මෙතෙක් පැවති පළාත් පාලන ආයතන ක්‍රමය යටතේ පුස්තකාල සේවාවල තත්ත්වය ගැන යුනෙස්කෝ විශේෂඥ සමුළුවේ වාර්තාවේ සඳහන් කළ කරුණු ගැන අවධානය යොමු කිරීම මෙහිදී අවස්ථානුකූල බව පෙනේ. එහි මෙසේ සඳහන් වේ.

''කිසිම මහජන පුස්තකාලයකට පොත්පත් ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයේ මුදල් නොමැත... විශාල පුස්තකාල කීපයක හැරෙන විට සෙසු පුස්තකාලවලට අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලයක්ද නැත.''

''බොහෝ පුස්තකාලවලට සේවා මට්ටම නිර්ණය කොට නැත. ළමා සේවයක් ඇත්තේ ඉතා කලාතුරකිනි. බොහෝ පුස්තකාලවල විශාලම ඉඩ ප්‍රමාණයක් වෙන් කොට ඇත්තේ ප්‍රවෘත්ති පත්‍ර හා සඟරා කියවීමටය.''

කියවීම් ශාලා

දැනයින්, විශේෂයෙන්ම ගම්බද පළාත්වල පුස්තකාලවල කැපී පෙනෙන ලක්ෂණය වන්නේ, ඉතා නොදියුණු තත්ත්වයයි. මෙම අවාසනාවන්ත තත්ත්වයට හේතුව කුමක්ද යන්න සොයා ගැනීම ඉතාම පහසුයි. මා කලින් සඳහන් කළ පරිදි පුස්තකාල සේවය අත්‍යවශ්‍ය සේවයක් ලෙස නොසැලකීම නිසා ඊට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබෙන්නේ නැ. මීටත් වැඩිය දැනට ඇති ක්‍රමය අනුව පළාත් පාලන ආයතනවලට ශක්තියක් නැ විධිමත් පුස්තකාල සේවයක් පවත්වාගෙන යෑමට. පුස්තකාල සේවයක්ය කියා හඳුන්වන්නේ ඇත්ත වශයෙන්ම ප්‍රවෘත්ති පත්‍ර කියවීම සඳහා ඇති ශාලාවකවිය.

1979 පුස්තකාල සේවා මණ්ඩලය විසින් දිපව්‍යාප්ත පුස්තකාල සමීක්ෂණයක් කරන ලද්දේ මේ තත්ත්වය යටතේය. මෙහි මූලික අරමුණ වූයේ මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම සඳහා පදනමක් සකස් කිරීමටය. මෙසේ ශ්‍රේණිගත කරනු ලබන පුස්තකාලවලින්, දිස්ත්‍රික් පුස්තකාල සේ දියුණු කළ හැකි පුස්තකාල සේ දියුණු කළ හැකි පුස්තකාල තෝරා ගැනීමද මෙම සමීක්ෂණයේ තවත් අරමුණකි. දැන් ක්‍රියාත්මක වීමට යන දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල ක්‍රමය යටතේ දිස්ත්‍රික් පුස්තකාල ගොඩ නැගීම සඳහා අවශ්‍ය වාතාවරණයක් ඇති වී තිබෙන බව සඳහන් කළ යුතුයි.

මණ්ඩලය විසින් රැස් කරන ලද තොරතුරු හා සංඛ්‍යා ලේඛන පදනම් කොට ගෙන මහජන පුස්තකාල ශ්‍රේණි 3 කට බෙදා වෙන් කොට තිබේ. i, ii හා iii ශ්‍රේණි වශයෙන් කොටස් කළ මෙම පුස්තකාල ඒ ශ්‍රේණිවලට තෝරා ගනු ලැබූයේ ප්‍රධාන වශයෙන් පුස්තකාල ගොඩනැගිලි පහසුකම් හා පොත් තොගය පදනම් කර ගෙනය. එකී පුස්තකාල ස්ථිර වශයෙන් මෙම ශ්‍රේණිවලට ඇතුළත් කාන්නේද යන්න නිගමනය කිරීමට පෙර පුස්තකාල පරීක්ෂා කිරීමට මණ්ඩලය අපේක්ෂා කරයි.

එම පරීක්ෂණසේදී.

(i) පුස්තකාලයේ පිහිටීම
(ii) අදල පළාත් පාලන ආයතනයේ ශ්‍රේණිය
(iii) මුදල් ප්‍රතිපාදන
(iv) ජනගහණය
(v) ගොඩනැගිලි පහසුකම්
(vi) සේවා පුළුල් කිරීමේ හැකියාව
(vii) ව්‍යාප්ති සේවා හා
(viii) අදල පළාත් පාලන ආයතන කොට්ඨාශය තුළ ඇති අධ්‍යාපනික හා සංස්කෘතික සංවිධාන

ගැන අවධානය යොමු කරනු ලැබේ.

පුස්තකාල ශ්‍රේණිගත කිරීම සඳහා දැනට නිගමනය කොට ඇති ප්‍රමිති ඉතා පහත් මට්ටමක ඇති බව සඳහන් කළ යුතුය. ආරම්භයේදී මීට වඩා ඉහළ මට්ටමක ප්‍රමිති නියම කිරීම ප්‍රායෝගික නොවේ. එහෙත් අවුරුදු 8 කට පසු යළිත් මෙම ප්‍රමිති නියම කොට ඇත්තේ බොහෝ කාලයක් උසස්වීමේ ක්‍රමයක් නොමැතිව අපේක්ෂා භංගව සිටින පුස්තකාලයාධිපතීන්ට සහනයක් සැපයීමේ අභිලාශයෙනි.

1979 සංඛ්‍යාලේඛන අනුව මෙම පුස්තකාල ශ්‍රේණිවලට ඇතුළත් කළ හෙයින්, දැන් තත්ත්වය පරීක්ෂා කොට නැවත ඒ ශ්‍රේණි ගැන සලකා බැලිය යුතුව ඇත.

දැනට ඇති තොරතුරු අනුව දිවයිනේ ඇති 600 ක් පමණ පුස්තකාල වලින් 10 ක් පමණක් ප්‍රථම ශ්‍රේණියට ඇතුළත් කළ හැක. 16 ක් දෙවෙනි ශ්‍රේණියටද 55 ක් 3 වැනි ශ්‍රේණියටද වර්ග කළ හැක. දෙවෙනි ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා තවත් පුස්තකාල 14ක් ගැන සැලකිල්ල යොමු වී තිබේ. මේ අනුව දිස්ත්‍රික්ක පුස්තකාල වශයෙන් සංවර්ධනය කළ හැකි පුස්තකාල 40 ක් තෝරා ගැනීමට හැක. එසේ වුවද, ආරම්භයේ දිස්ත්‍රික් පුස්තකාල තත්ත්වයට නම් කළ හැක්කේ 1 ශ්‍රේණියේ පුස්තකාල 10 ක් පමණයි. අවශ්‍ය පමණ 1 වැනි ශ්‍රේණියේ පුස්තකාල සංඛ්‍යාවක් නොමැති හෙයින් තාවකාලිකව 2 ශ්‍රේණියේ පුස්තකාල දිස්ත්‍රික් පුස්තකාල ලෙස නම් කිරීමට සිදු වේ.

සංවර්ධන වැඩ පිළිවෙල

ශ්‍රී ලංකාවේ එක්කෝටි හතලිස් පන් ලක්ෂයකට අධික ජනගහනයෙන් වැඩි කොටසක් වාසය කරන්නේ ගම්බදවය. දිවයිනේ මුළු බිම් ප්‍රමාණය වන වර්ග සැතපුම් 25,000 න්, බටහිර ප්‍රදේශයේ ජනගහණය ඉතා ඝනව වැඩි ඇත. කෙසේ වුවද සාමාන්‍යයෙන් වර්ග සැතපුමකට මිනිසුන් 504 ක ජනගහණයක් ලංකාවේ ඇති හෙයින් බොහෝ පළාත් පාලන ආයතන කොට්ඨාශවල විශාල ජනගහණයක් ඇති බව පෙනේ.

ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 77.67 ක් ගම්බද වාසය කරන බව නිගමනය කොට ඇත.

දිස්ත්‍රික් පුස්තකාල ක්‍රමය සැලසුම් කිරීමේදී මෙම ජනගහන රටාව අනුගමනය කර ඇත.

සංවර්ධන යෝජනා ක්‍රමයෙහි විශේෂයෙන් අප විසින් සලකා බලනු ඇත්තේ පුස්තකාලයට අවශ්‍ය

1. ගොඩනැගිලි පහසුකම්
2. පොත් තොගය
3. ලී බඩු හා උපකරණ
4. කාර්ය මණ්ඩලය
5. සේවා හා මුදල් ප්‍රතිපාදන දියුණු කිරීමය.

ඉහත සඳහන් අවශ්‍යතා සපුරා දිස්ත්‍රික්ක පුස්තකාලවල තත්ත්වය උසස් කිරීමට හැකි හැම උත්සාහයක්ම ගැනීම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සභාපතිවරු, නගරාධිපතිවරු සහකාර කොමසාරිස්වරු විසින් දක්වන උනන්දුව සහ උපකාරය මතයි මෙම ව්‍යාපාරය සාර්ථක කර ගත හැක්කේ ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් වෘත්තීමය වශයෙන් අවශ්‍ය සියළු ආධාර හා උපකාර සපයනු ඇත. විශේෂයෙන් පහත සඳහන් අංශ සම්බන්ධයෙන් මණ්ඩලයේ සහාය පළාත් පාලන ආයතනවලට අවශ්‍ය වනු ඇත.

1. කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පාඨමාලා, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම.
2. පුස්තකාල පාලනය/ සංවිධානය පිළිබඳ වෘත්තීමය ලිපි ලේඛන, තොරතුරු පොත්ලැයිස්තු පිළියෙල කිරීම පුස්තකාල භාණ්ඩ හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමිති, වෙනත් වෘත්තීමය තොරතුරු.

6 වන පිටුවට . . .

දිස්ත්‍රික් පුස්තකාල සම්මන්ත්‍රණයේදී මහජන පුස්තකාල පණතක අවශ්‍යතාවය පිළිබඳව පුස්තකල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ එස්. එම්. කමල්දීන් මහතා කරුණු ඉදිරිපත් කළ අවස්ථාව.

දිස්ත්‍රික් පුස්තකාල...

(6 වන පිටුවෙන් ඉකිරි)

3. ගොඩනැගිලි, සේවා අංග සංවිධානය, උපකරණ ලිඛිත භාවිතය පිළිබඳ උපදෙස්, කාර්ය මණ්ඩලය පිළිබඳ පරිපාලනමය වැන්තිය උපදෙස්, දොත් තොගය ගොඩනඟා ගැනීම, ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම පුස්තකාල සහයෝගිතා වැඩ පිළිවෙල සකස් කිරීම හා මහජන සම්බන්ධතා සම්බන්ධයෙන් උපදෙස් හා උපකාර සැපයීම.

මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන පිළිවෙල්ව දිස්ත්‍රික් පුස්තකාල සංවර්ධනය කිරීමෙන් පසු එම පුස්තකාල පිහිටා ඇති ප්‍රදේශවල මහජනතාවට මෙන්ම දිස්ත්‍රික් කය පුරාම සේවා රැසක් ඉටු කිරීමට සමත්වනවා ඇත.

පුස්තකාලය අයත් පළාත් පාලන ආයතන කොට්ඨාශයකට අයිති ප්‍රදේශයෙහි පමත සඳහන් සේවා සැපයීම දිස්ත්‍රික්ක පුස්තකාලයකට කළ හැක.

1. චලමාණ පුස්තකාල පහසුකම්
2. ප්‍රාදේශිය ඉතිහාසය හා තොරතුරු රැස් කිරීම
3. පැරණි නිවේස්වලට කියවීමේ පහසුකම් ලබා දීම
4. කියවීම් ශාලා ඇති කිරීම
5. ළමා පුස්තකාල සේවා
6. ශාරීරික දුබලතාවයන් ගෙන් පෙළෙන අය සඳහා පුස්තකාල පහසු කම් ඇති කිරීම
7. ශ්‍රව්‍ය / දෘශ්‍ය සේවා (ගුවන්විදුලිය, රූපවාහිනිය, කැසට් පට්, චිත්‍ර පට් යනාදිය)
8. ව්‍යාප්ති සේවා.

පළාතේ ඇති කුඩා පුස්තකාලවලින් ලබන ආධාර උපකාර සැපයීමෙන්ද එම පුස්තකාල වල කටයුතු හා ප්‍රධාන පුස්තකාලයේ කටයුතු ඒකාබද්ධ කිරීමෙන්ද දිස්ත්‍රික් පුස්තකාලය අදාල ප්‍රදේශයේ පුස්තකාල සේවා පිළිබඳ නායකත්වය ගෙන කටයුතු කිරීමට හැකි වනවා ඇත. එවිට දිස්ත්‍රික් පුස්තකාලය කුඩා පුස්තකාලවලට ආදර්ශයක් විනු ඇත.

ඇතැම් දිස්ත්‍රික්කවල ජනඝණය ඉතාමත් විශාල හෙයින් එක් දිස්ත්‍රික් පුස්තකාලයක් පමණක් ප්‍රමාණවත් නොවන්නට පුළුවනි. අනික් අතින් ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් නොමැති දිස්ත්‍රික්කවල දැනට ඇති පුස්තකාල වැඩි දියුණු කොට දිස්ත්‍රික් මධ්‍යස්ථානයට ගෙන ආ යුතුයි. ජාතික මට්ටමේ පුස්තකාල සේවයක් ඇතිවීමේ අවශ්‍යතාවය මත්තේ මෙම කාර්යය ඉටු කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම සමාන තත්වයක දියුණු වූ පුස්තකාල තිබීම අවශ්‍යතාවයක්.

දිස්ත්‍රික් පුස්තකාලයක් විසින් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රදේශවලට පහත සඳහන් සේවා සැපයීම අවශ්‍යයි.

1. ජංගම පුස්තකාල සේවය;

ගම්බදව ඇති කුඩා පුස්තකාලවල ඇත්තේ අඩු සුළු ප්‍රමාණයක පොත්පත් හෙයින් ජංගම පුස්තකාල සේවයක් මඟින් එම පුස්තකාලවල පොත් තොගය ශක්තිමත් කර ගත හැක. කුඩා පුස්තකාල සියල්ලම දිස්ත්‍රික් පුස්තකාලයේ ශාඛා පුස්තකාල වශයෙන් සංවිධාන කිරීම අවශ්‍ය වනවා. එසේ කිරීමෙන් දිස්ත්‍රික් පුස්තකාලයේ පොත් බැංකුවක ඇති පොත්පත් වරින් වර කොටස් වශයෙන් කුඩා පුස්තකාල පාවිච්චියට දීමටත් එමඟින් අළුත් පොත් නොකඩවා පාඨකයින්ට ලබා දීමටත් හැකිවනවා. එපමණක් විවිධ විෂයයන් හා ක්ෂේත්‍ර පිළිබඳ පොත් රාශියක්ද ලබා දීමට අවස්ථාව ලැබෙනවා. දිස්ත්‍රික් පුස්තකාල තොග වෙළඳ ආයතනයක් මෙන්ද කුඩා පුස්තකාල සිල්ලර වෙළඳ ආයතනයක් මෙන්ද කටයුතු කරන්නට පුළුවන්.

මේ සම්බන්ධයෙන් දැනට පළාත් පාලන සහකාර කොමිසාරිස්වරුන් විසින් සිය ප්‍රදේශවල කුඩා පුස්තකාලයන් මඟින් පොත් පිරුළට දීමේ ක්‍රමයක් ආරම්භ කොට ඇති බව සතුටින් සඳහන් කළ යුතුය. ඒ මඟින් කුඩා පුස්තකාලවල සීමිත පොත් සම්පත් සෑහෙන ප්‍රමාණයකට දියුණු වන බව කිවයුතුය. මේ පරමාර්ථය ඇතිව පුස්තකාල සේවා මණ්ඩලය විසින්ද පොත් පෙට්ටි මඟින් කුඩා පුස්තකාලවලට අළුත් පොත් ලබා ගැනීමේ ක්‍රමයක් සංවිධානය කොට ඇත. මේවායින් ලැබෙන ප්‍රයෝජන සීමිතය. වඩා හොඳ සේවයක් සැපයිය හැක්කේ දිස්ත්‍රික් පුස්තකාල මඟිනි. ඒ සඳහා රථවාහන පහසුකම්ද දිස්ත්‍රික් පුස්තකාලවලට ලබාදිය යුතුය.

2. පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා සේවාස්ථ පුහුණුව;

දිස්ත්‍රික් පුස්තකාලය භාරව කටයුතු කරන පුස්තකාලයාධිපතිවරයා වෘත්තිය සුදුසුකම් ලත් පුහුණු නිලධාරියෙකු හෙයින් දිස්ත්‍රික්කයේ කුඩා පුස්තකාලවලට අවශ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම දිස්ත්‍රික් පුස්තකාලයාධිපතිට ඉටු කළ හැකියැ. දැනට එවැනි සේවාස්ථ පුහුණුවීමේ පහසුකම් ඇත්තේ කොළඹ ඇති පුස්තකාල එක දෙකක පමණක් හෙයින් විධිමත් අබණ්ඩ සේවාස්ථා පුහුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අපහසු වී තිබේ. විශේෂයෙන් දුර බැහැර ඇති පුස්තකාල කාර්ය මණ්ඩලයට කොළඹට පැමිණීම දුෂ්කරය.

3 මධ්‍යගත ග්‍රන්ථ පරිගණකය, සූචිකරණය හා භාවිතයට ග්‍රන්ථ සකස් කිරීම;

කුඩා පුස්තකාලවලට මුහුණ දෑමට සිදුවී ඇති අතිමහත් දුෂ්කරතාවයක් වනුයේ පොත් තේරීම්, සූචිගත කිරීම, වර්ගීකරණය යනාදිය සඳහා අවශ්‍ය ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය හා එම කාර්යයන් සඳහා අවශ්‍ය පුහුණු පුස්තකාල කාර්ය මණ්ඩලයක් නොමැති වීමය. මීට ඉතාම සුදුසු පිළියම වන්නේ එවැනි කාර්ය මණ්ඩලයක් ඇති දිස්ත්‍රික් පුස්තකාලයෙන් මෙම කාර්යයන් මධ්‍යගත සේවා වශයෙන් ඉටු කිරීමය. එවිට හැම පුස්තකාලයටම එකවර සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් හෝ වෙවලම් අවශ්‍ය නොවේ. තවද, එවැනි මධ්‍යස්ථානයකින් මෙකී කාර්යන් කිරීමෙන් එම කඩිසුතුවල සේවා තත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගත හැකිය. දිස්ත්‍රික්කය තුළ මෙම කාර්යයන්ගේ ඒකාබද්ධතාවයක්ද ඇති වන්නේය. පුස්තකාල මණ්ඩලයට මෙම කඩිසුත්ත සංවිධානය කර දිය හැක.

4. පොත් බැඳීමේ මධ්‍ය කාර්යාංශ;

සිංහල හා දෙමළ මාධ්‍ය යෙන් නිකුත් වන පොත් වල නිෂ්පාදන තත්ත්වය ඉතා අසතුටුදායක බව නොරහසකි. මෙම පොත් පුස්තකාලවල ප්‍රයෝජනයට යෙදීමට පෙර බැඳීම අවශ්‍යය. නමුත් ඒසා විශාල පොත් තොගයක් බැඳීමට විශාල මුදලක් වැය විය යුතු හෙයින් කුඩා පුස්තකාල වලට එය නොකළ හැක්කකි. නමුත් දිස්ත්‍රික් පුස්තකාලයක පොත් බැඳීමේ අංගයක් ඇති කොට දිස්ත්‍රික්කයේ සියළු පුස්තකාලවලට පොත් බැඳීමේ මධ්‍යගත සේවයක් ආරම්භ කළ හැක. ඇතැම් විට සෑහෙන ලාභයක් ලැබෙන පරිදි මෙම සංවිධානය කළ ගතහොත් ඊට අවශ්‍ය කාර්ය මණ්ඩලයට වේතනය ගෙවීමද එම ලාභ වලින්ම පියවාගත හැක. පුස්තකාලයේ මුදල් මේ සඳහා වැය කිරීම එවිට අනවශ්‍යය.

5. මධ්‍ය විමර්ශණ සේවා;

විමර්ශණ සේවා දිස්ත්‍රික්කය තුළ මෙන්ම දිස්ත්‍රික්කයෙන් බාහිරවද සැපයීම දිස්ත්‍රික්ක පුස්තකාලයක විදගත් කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් ජාතික පුස්තකාල මණ්ඩලයේ කාර්ය භාරය ගැන මතක් කිරීම කාලෝචිතය.

ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අරමුණ වන්නේ පුස්තකාල සේවා ජද්ධතියක් ඇති කිරීමය. අනාගතයේදී පුස්තකාල සේවා සැලසුම් කළ යුත්තේ එම අරමුණ ඇතිවය. ජාතික පුස්තකාල සේවයක් ඇති කිරීමෙන් පුස්තකාල පාලනය කිරීම අදහස් නොකෙරේ. එයින් අදහස් කෙරෙන්නේ කිසිම සම්බන්ධතාවයක් නොමැතිව' එකාබද්ධතාවයක් නොමැතිව දස අතේ විසිරී ඇති පුස්තකාල සම්පත් හා සේවාදීන් සම්බන්ධීකරණය කොට, එහි ශක්තියෙන් ජාතික විශ්වයෙන් හෝ අන්තර් ජාතික විශ්වයෙන් පාඨකයෙකුට නෝ පුස්තකාලයට ලබා දිය හැකි උපරිම ප්‍රයෝජනය ලබා දීමය.

ප්‍රායෝගික විශ්වයෙන් සලකන විට මෙයින් අදහස් කරන්නේ කුඩා ගැමී පුස්තකාල නගරබද විශාල පුස්තකාලවලට සම්බන්ධ වන අතර නාගරික පුස්තකාල දිස්ත්‍රික් පුස්තකාලවලට සම්බන්ධ කිරීමය.

දිස්ත්‍රික්ක පුස්තකාල ජාතික පුස්තකාලයට සම්බන්ධ වනු ඇත. ජාතික පුස්තකාලය ලෝකයේ වෙනත් රටවල ජාතික පුස්තකාලවලට සම්බන්ධ වනු ඇත. මෙසේ ලෝකයේ ඇති විශ්ව ඥානය ඔබේ අතට පත් කිරීමට හැකිය.

6. අන්තර් පුස්තකාල පොත් හුවමාරු:

යම්කිසි පුස්තකාලයක නැති පොතක් වෙනත් පුස්තකාලයකින් ඉල්ලා ගැනීම පමණක් ''අන්තර් පුස්තකාල පොත් හුවමාරු'' යන්නෙන් අදහස් නොවෙකේරේ. එයින් අදහස් කරන්නේ රටේ ඇති ඕනෑම පුස්තකාලයකින් එසේ නැතහොත් විදේශ පුස්තකාලයකින් වුවත් පාඨකයෙකුට පොත් ලබා ගැනීමේ ක්‍රමයකි. දිස්ත්‍රික් කය තුළ මෙන්ම විවිධ දිස්ත්‍රික්ක අතර පොත් හුවමාරු දිස්ත්‍රික්ක පුස්තකාලයට කළ හැක. රටේ ඇති සියළුම පුස්තකාල එවැනි වැඩ පිළිවෙළකට සහයෝගය දක් වූ වහොත් එය මුළු රටම එක් පුස්තකාලයක් වූවා හා සමානය.

7. ශ්‍රව්‍ය-දෘශ්‍ය සේවා හා පිරුළු සේවාව:

මිළ වැඩිකම නිසා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් නිකුත් වී ඇති පාඨක ද්‍රව්‍ය ලංකාවේ මහජන පුස්තකාලවල ඇත්තේම නැතැයි කිව හැක. ඒ නිසා පුස්තකාලවලට ලබා ගනු ලබන්නේ පොත් පමණය. නමුත් මෑතකදී සිට පුස්තකාල තම පාඨකයින් සඳහා විදේශීය තානාපති කාර්යාල හා වෙනත් ආයතන වලින් චිත්‍රපට, සේයා තහඩු, ටේප් වැනි ද්‍රව්‍ය හා උපකරණ ඉල්ලා ගැනීමට පටන් ගෙන තිබේ. මේ තත්වය යටතේ යටත් පිරිසෙයින් දිස්ත්‍රික්ක මහජන පුස්තකාලයේවත් මෙම ද්‍රව්‍ය එකතුවක් ගොඩනැගීමෙන් කුඩා පුස්තකාල වලට මහත් සෙතක් සිදුවේ.

8. පාසැල් පුස්තකාලවලට සේවා සැපයීම;

පාසැල්වලට අවශ්‍ය පුස්තකාල පහසුකම් සැපයීම අධ්‍යාපන අමාත්‍යාංශයට මුහුණ පෑමට ඇති බලවත් ප්‍රශ්නයකි. මණ්ඩලය විසින් මෑතකදී පාසැල් පුස්තකාල පිළිබඳ, කරන ලද සමීක්ෂණයකදී හෙළිවූ දරුණු පාසැල් 10,000 කින් පුස්තකාල ඇත්තේ 750 ක පමණයි. එහෙයින් පාසැල් ශිෂ්‍යයින්ගේ පුස්තකාල අවශ්‍යතා සපුරාලීමේ මහජන පුස්තකාල වලට මහත් වගකීමක් ඇත්තේ වෙනවා. දැනටමත් මහජන පුස්තකාල පාවිච්චි කරන අඟෙහෝ වැඩි දෙනෙක් පාසැල් සිසුන් බව අපි දන්නවා.

පාසැල්වල පුස්තකාල නොමැති අවස්ථාවලදී ජංගම සේවා මගින් පාසැල්වලට පොත් සේවයක් ඇරඹීම කිරීමට දිස්ත්‍රික් පුස්තකාල උත්සාහ කළ යුතුයි. විධාන විශ්ව විද්‍යාලය ආරම්භ වී ඇති මෙම අවස්ථාවේ මහජන පුස්තකාල වලට විශ්ව විශ්ව විද්‍යාල සිසුන්ගේ පොත්පත් අවශ්‍යතාවන්ද සපුරාලීමට සිදුවේ.

විශේෂයෙන් දිස්ත්‍රික් පුස්තකාල මෙම සේවා ගැන අවධාරණය යොමු කළ යුතුවේ.

9. විශේෂ එකතුන්;

දිස්ත්‍රික් පුස්තකාල දියුණු වීගෙන යන විට ක්‍රමයෙන් එක් එක් විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සියළු පොත් පත් රැස් කිරීමට කටයුතු කිරීම ප්‍රඥාගොචරය. එසේ විෂයයන් තෝරා ගැනීමේදී වෙනත් දිස්ත්‍රික්ක පුස්තකාල සමඟ සාකච්ඡා කොට එම විෂයයන් බෙදාහෝ ගැනීමක් එසේ පුස්තකාල අතර බෙදා ගත හැක. මෙම ක්‍රමය එක්සත් රාජධානියේ ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ.

ජාතික මට්ටමේ හොඳ පුස්තකාල සේවයක් සඳහා මහජන පුස්තකාල අතර සාර්ථක සම්බන්ධීකරණයක් හා සහයෝගයක් තිබිය යුතු බව දිස්ත්‍රික් පුස්තකාල සම්බන්ධයෙන් ඉහතින් දක්වූ කරුණුවලින් මනාව පැහැදිලි වේ.

මෙම ව්‍යාපෘතියේදී ජාතික පුස්තකාල සේවා මණ්ඩල විසින් ඉටු විය යුතු කාර්යභාරයද පැහැදිලිය. යෝජිත පුස්තකාල සේවා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී හැම අවස්ථාවේම පුස්තකාල සේවා මණ්ඩලයේ මඟපෙන්වීම හා උපදෙස් අවශ්‍ය විනු නොඅනුමානය. මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුත්තේ මණ්ඩලයේ කාර්යභාරයෙන් උපදෙස් හා උපකාර සැපයීමට පමණක් සීමා විය යුතුය යන්නය. ක්‍රමවත් ප්‍රයෝජනවත් පුස්තකාල සේවයක් ගොඩනැගීමේ වැඩ කිම සම්පූර්ණයෙන්ම දිස්ත්‍රික් පුස්තකාලය සතු විය යුතුය.

දිස්ත්‍රික් පුස්තකාලයක කටයුතු කෙටියෙන් මෙසේ දැක්විය හැක;

(1) ග්‍රාමීය මට්ටමෙන්
(අ) විමර්ශණ සේවා
(ආ) ප්‍රාදේශික ඉතිහාසය

(7 වන පිටුව බලන්න)

පුස්තකාල අධ්‍යාපන

පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස් 1

පාසල් පුස්තකාලයේ අරමුණ

පාසැල් අධ්‍යාපන කාර්යයන්ට අතදීම පාසල් පුස්තකාලයක ප්‍රධාන පරමාර්ථය වෙයි. පාසල් පුස්තකාලයේ ඇති සෑම දෙයක්ම එහි තිබිය යුත්තේත් ඒවා සංවිධානය කළ යුත්තේත් ශිෂ්‍යයිනට උපකාර කිරීම අරමුණ කොට ගෙනය. ඇතැම් විට ළමයින්ට කෙළින්ම උපකාර විය හැකිය. ඇතැම් විට ගුරු මණ්ඩලයේ මාර්ගයෙන් එසේ කළ හැක.

ශිෂ්‍යයින්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට හැකිවනු පරිදි අවශ්‍යතා සපුරාලීමත්, දැනුම මෙන්ම විනෝදය හා විවේකය සඳහා පුස්තකාලය භාවිතා කිරීමට ශිෂ්‍යයින් උනන්දු කරවීමත් පාසල් පුස්තකාලයේ අරමුණ විය යුතුය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පාසලේ පුස්තකාලය නිර්මාණ ක්‍රම සංවිධානය කළ ගැනීම සඳහා පොත පත යුතුය. ගුරුවරුන්ට ඉගැන්වීමෙදී පුස්තකාලය උපකාර කර ගත හැකි වනසේ සංවිධානය වී තිබීමද අත්‍යාවශ්‍යය.

තොරතුරු මධ්‍යස්ථානයක්

පාසලේ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතු වලදී අවශ්‍ය වන දැනුම ලබාදීමට පුස්තකාලය සමන්විත විය යුතුය. පාසලේ ඉගෙන ගන්නා විෂයයන් පිළිබඳ තොරතුරු පමණක් නොව ශිෂ්‍යයින් කැමති වෙනත් කරුණු ගැන තොරතුරු සොයා ගැනීමටද පුස්තකාලය ප්‍රයෝජනවත් විය යුතුය. මිනිසාගේ දියුණුව හා සංස්කෘතිය පදනම් වී ඇත්තේ පොත පතෙහි හා වෙනත් මාධ්‍යවල රැඳී ඇති දැනුම



පාඨකයින්ට කියවීමට අවශ්‍ය කරන පොත පත පහසුවෙන් නෝරා ගැනීමට හැකිවන අන්දමට සහ ක්‍රමානුකූලව පොත් රැස්කර තැබීමද පුස්තකාලයක සිදුවිය යුතුය.

පාසලේ අධ්‍යාපන වැඩ පිළිවෙලෙහි අත්‍යාවශ්‍ය අංගයක් ලෙස පිළිගැනීම අවශ්‍යය. එසේම පුස්තකාලය කේන්ද්‍ර ස්ථානයක් ලෙස සළකා ඉගැන්වීමේදී පුස්තකාලය උපකාර කර ගත හැකි වනසේ සංවිධානය වී තිබීමද අත්‍යාවශ්‍යය.

තොරතුරු හා දැනුම සැපයීම

පාසල් පුස්තකාලයක මූලික වගකීමකි.

පුස්තකාල ගුරුවරු

ශිෂ්‍යයින් වැඩි වියට පැමිණෙන විට පාසල් හැර යෑමෙන් පසු තම තමන්ගේ දැනුම වර්ධනය කර ගන්නා ක්‍රම පිළිබඳවත් එසේ කරගත හැකි බවට විශ්වාසයක්ද ඔවුන් තුල ගොඩ නැගී තිබිය යුතුය. පාසල් අවදියේදී තම තමන්ට අවශ්‍ය වූ දැනුම හා තොරතුරු ලබා දීමට පුස්තකාලය සමත් වූයේ නම්, පුස්තකාලයකින් දැනුම ලබා ගැනීමට හැකි බව ඒත්තු ගත් ශිෂ්‍යයෝ පසු කාලයේදී තමනට ඇති වන අවශ්‍යතා වලදී ද පුස්තකාල භාවිතයට ඔව්හු නිරායාසයෙන්ම යොමු වෙති.

පාසල් අවධියෙන් පසු සමාජයට පිවිසෙන යෞවන පුරවැසියන්ට පුස්තකාලය ස්වකීය බුද්ධි වර්ධනයට රුකුලක් කරගත හැකි බව ඒත්තු යන පරිදි, පාසල් පුස්තකාල මනාව සංවිධානය කොට ඒවා පරිහරණය කිරීමෙහි ශිෂ්‍යයින් පුහුණු කරවීම ළමයින්ට පාසල් පුස්තකාලයකින් ලබා දිය හැකි මහඟු සේවයකි.

අධ්‍යාපන වැදගත්කම

අධ්‍යාපන ක්‍රියාවලියේ ක්‍රියාශීලීව සහභාගිවන ළමයින් ඉතා හොඳින් ඉගෙන ගන්නා බව පරීක්ෂණ වලින් පෙනී ගොස් ඇත. පංති කාමරයේ වාඩිවී ගුරුවරයා කියන දේ අසා සිටීමෙන් ලබන ඉගෙනීම, තමා විසින්ම සොයා දැන ඉගෙන ගැනීම තරම් අර්ථවත් නොවන බව නොරහසකි.

ශිෂ්‍යයන් ලවා වැඩි වැඩියෙන් පොත් පත් පරිශීලනය කොට තොරතුරු සොයා ගැනීමට හැකිවන පරිදි ගුරුවරු සිය පාඩම් සංවිධානය කර ගන්නේනම් ශිෂ්‍යයින් වඩ වඩා සිය උත්සාහයෙන් ඉගෙන ගැනීමට හුරු පුරුදු කම් ලබති.

විශේෂ
ලේඛකයකු විසිනි.

පත්‍ර කලා පුහුණුවක්

පුවත් පත් ප්‍රවෘත්ති කලාවේදීන්ට පුවත්පත් කලාවේ සියලුම අංග පිළිබඳව පුළුල් පුහුණුවක් ලබා දීමේ පාඨමාලාවක් ලෝක පුවත් පත් කලාවේදීන්ගේ කතෝලික සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව වන 'ප්‍රජාකිස' මඟින් ආරම්භකර ඇත.

මෙම පාඨමාලාවේ ආරම්භක දිනය නිමිත්තෙන් කොළඹ සයවන පාවුළු මධ්‍යස්ථානයේ පැවැත්වූ උත්සවයට රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සරත් අමුණුගම සශ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක අනුර ගුණසේකර යන මහත්වරුන් ද සහභාගි වූහ.

ප්‍රවීන පත්‍ර කලාවේදියකු වන ඇම්.ඒ. ද සිල්වා මහතා මෙහෙයවන මෙම පාඨමාලාවේ සංවිධාන කටයුතු භාරව ඥානාලී ප්‍රදීපය' ප්‍රධාන කර්තෘ හෙක්ටර් වෙල්ගම්පල මහතා සහ ගරු නොයෙලින් මැන්දිස් සොහොයුරිය ක්‍රියාකරයි.

සරසවි සිසුන්ට සෙත

දිවයිනේ සියලුම විශ්ව විද්‍යාලවල සිසුන්ට ප්‍රමාණවත් පරිදි පුස්තකාල පහසුකම් ලබා දීම සඳහා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමති ඒ. ආර් ඇම්. බී. අත්තනායක මහතා පියවර ගෙන තිබේ.

විදෙස් පුවත්

දුරකථන නියමුවන්ට තිළිණ පිරිනමයි

ඇමරිකාවේ දුරකතන නියමුවන් සඳහා අගය කිරීමේ සහතික පත් ප්‍රදානයක් නොබෝ දා ඇමරිකාවේ හොලිවුඩ්හිදී සිදුකරන ලදී.

දුරකථන නියමුවන් විසින් ගතවූ විසි වසරක කාලයක් තුල එරට ජාතික පුස්තකාල සේවයේ අන්ධ හා අංග විකල පාඨක ජනතාව වෙනුවෙන් කරන ලද සේවය අගය කිරීම සඳහා සහතික පත් පිරිනමන ලද බව වාර්තා වේ.

සහතික පත් ප්‍රදානය කරන ලද්දේ ඇමරිකාවේ ජාතික පුස්තකාල සේවයේ සහය අධ්‍යක්ෂිකා මේරි ජැක් වින්ටල් මහත්මිය විසිනි.

ඕස්ට්‍රේලියාවේ කෙළි බඩු පුස්තකාල ජනප්‍රියයි

අංග විකල දරුවන් සඳහා වන කෙළි බඩු පුස්තකාල සේවය ඕස්ට්‍රේලියාවේ ඉතාමත් ජනප්‍රිය සේවාවක් බවට පත් වී ඇත. මේ නිසා දැන් එරට ජාතික මට්ටමේ කෙළි බඩු පුස්තකාල සේවා සංවිධානයක් ක්‍රියාත්මකව පවති.

මෙම ජාතික සංවිධානයේ අරමුණු වශයෙන් ජාතික හා අන්තර් ජාතික වශයෙන් අදහස් හුවමාරුව පහසුකරවීමටත් අංග විකල දරුවන් ගැනත් ඔවුන් හැදීම හා වැඩීම පිළිබඳව නව අදහස් හා තොරතුරු පතුරුවා හැරීමද මූලික වෙයි.

උක් රොඩු වලින් කඩදාසි

ජපානයේ කාර්මික විද්‍යාත්මක හා තාක්ෂණික නියෝජිතායතනය විසින් ඉවත දමනු ලබන උක් රොඩු වලින් කඩදාසි නිපදවීමේ හැකියාව ගැන දැන් පරීක්ෂණ පවත්වනු ලබයි.

අන්ධ ජනතාවට කියවීම් පහසුකම් සලසන නව යන්ත්‍රයක්

අන්ධ ජනතාවට කියවීම් පහසුකම් සලසනකර්ස්වෙයිල් (Kurzweil) කියවන යන්ත්‍රයක් පුස්තකාල සංවිධානය විසින් ලබාගෙන ඇත.

මෙම කියවන යන්ත්‍රය නිසා කරුණු සමීක්ෂණයේ යෙදෙන මෙතෙක් බ්‍රේල් ක්‍රමයෙන් හෝ වෙනත් පුද්ගයන් විසින් කියවාදීමෙන් කරුණු රැස් කර ගැනීමේ යෙදුණු ඉංග්‍රීසි දන්නා අන්ධ පිරිසට වඩාත් පහසුවෙන් තමන්ගේ සමීක්ෂණ පවත්වා ගෙන යාමට අවස්ථාව සැලසී ඇත.

මෙම කියවන යන්ත්‍රය රේමන්ඩ කර්ස්වෙයිල් විසින් සොයා ගන්නා ලද්දකි. මෙය වැඩි දියුණු කර අද තිබෙන තත්වයට ගෙනෙන ලද්දේ කේම්බ්‍රිජ්හි කර්ස්වෙයිල් පරිගණක යන්ත්‍ර සමාගම මඟිනි. තාක්ෂණික දියුණුවේ වැදගත් අවස්ථාවක් ලෙස හඳුන්වනු ලබන මෙය අන්ධ අයට මෙන්ම අංග විකල අයටද එකසේ ප්‍රයෝජනවත්ය.

විදුලි බලයෙන් ක්‍රියා කරන කියවන යන්ත්‍රයේ වීදුරු තලය මුනින් අතට දමා තිබෙන මුද්‍රිත අකුරු-කුඩා පරිමාණයේ පරිගණක යන්ත්‍රය මඟින් හඳුනා ගෙන ඒ ඒ අකුරු වචන වශයෙන් ගොනු කරයි. අනතුරුව පරිගණක යන්ත්‍රය වචන උච්චාරණය කිරීමෙන් කෘතිම කියවීමක් කරයි. කියවීමේ සව්‍යතාවය කඩිනම් කළ යුතු නම්, මනා පළපුරුද්දක් ඇතිව සිටින පරිගණක යන්ත්‍ර ක්‍රියා කරවන්නාට මෙම කෘතිම කියවීම හැසිර විය හැකිය.

අවශ්‍ය නම් පුන පුනා කියැවීම ද පසුව බලා ගැනීම සඳහා යම් යම් වචන සලකුණු කිරීමද මේ යන්ත්‍රය මඟින් කරවා ගත හැකිය.

අන්ධ හා අංග විකල අය සඳහා වන ජාතික පුස්තකාල සේවයේ ඉල්ලීම යටතේ නිශ්පාදනය කරන ලද මෙම කියවන යන්ත්‍රය බ්‍රේල් ක්‍රමය නිපදවන යන්ත්‍රය අනුව යමින් නිශ්පාදනය කරන ලද්දකි. දැන් මේ යන්ත්‍රය ජාතික පුස්තකාලය මඟින් පරීක්ෂණවලට යොමු කර ඇත.

පාසැල් සිසුනට.....

(1 වන පිටුවෙන්)

මෙම වැඩ පිවෙල යටතේ ඉදිරියේදී දිවයිනේ සියලුම දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසැල් වල දරු දැරියන්ටද තම තමන්ගේ පාසැල් වල සිටම අධ්‍යාපනික විටිනාකම් කින් යුත් පොත් පත් කියවීමට අවස්ථාව සලසා දීමටද ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අවශ්‍ය විධි විධාන යොදා ගෙන යයි.

පුස්තකාල ප්‍රවෘත්ති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ත්‍රෛමාසික ප්‍රකාශනය

நூலகச் செய்தி

LIBRARY NEWS

පාසල් පුස්තකාල තොරතුරු සොයයි

දිවයිනේ පාසල් පුස්තකාල දැනට පවතින තත්වයට වඩා උසස් මට්ටමකට ගෙන ඒමට ක්‍රමවත් පියවර ගැනීම සඳහා එම පුස්තකාල පිළිබඳව තොරතුරු සොයා බැලීමේ සමීක්ෂණයක් පසුගියද පවත්වනු ලැබිණි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීමක් පරිදි පවත්වනු ලැබූ මෙම සමීක්ෂණයේදී ළමා පුස්තකාල කෞර්ය මණ්ඩල, ගොඩනැගිලි, උපකරණ, අඩු පාඩු, පොත් තොග. පුස්තකාල විවෘතකර තැබෙන කාල වේලාවන් පිළිබඳව තොරතුරු ඒකරාශි කරගැනීමට හැකිවී ඇත.

මෙම සමීක්ෂණයේදී දැනගැනීම හැකිවූ සියලුම කරුණු සවිස්තරව ඇතුළත්ව පිළියෙළ කෙරුනු වාර්තාවක් අධ්‍යාපන ඇමති රනිල් වික්‍රමසිංහ මහතා වෙත ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් බාරදීමට නියමිතය.

இலங்கைப்பாடசாலை நூலகங்களின் மதிப்பீடு

தேசிய அடிப்படையில் இலங்கைப் பாடசாலைகள் அனைத்திலுமுள்ள நூலகங்களின் மதிப்பீடொன்று இலங்கை நூலகசேவைகள் சபையினால் அண்மையில் மேற்கொள்ளப்பட்டது.

இப்பாடசாலை நூலகங்களின் தற்போதைய நிலைமையைப் படிவம் இயற்றின் அபிவிருத்திக்கான வழிவகைகள் பற்றியும் விளக்கிக்கூறும் அறிக்கை யொன்று தற்போது தயாரிக்கப்பட்டு வருகிறது.

இந்த மதிப்பீட்டில் வெளியான முக்கியமான தகவல், எமது பாடசாலை நூலகங்களில் கடமையாற்றுவதற்குப் போதுமான அளவு நூலகர்கள் இல்லை யென்பதேயாகும்.

இந்த அறிக்கையில் மாணவர் தொகை, நூலகக் கட்டிட வசதி, நூற்தொகை சேவையாளர்கள், நிதி, சேவை நேரங்கள், நூலகக் கல்வி, பயிற்சி முதலிய விடயங்கள் பற்றி ஆராயப்பட்டுள்ளது. இவ்வறிக்கையை விரைவில் மாண்புமிகு கல்வி அமைச்சர் ரனில் விக்ரமசிங்கவுக்கு நூலகசபை சமர்ப்பிக்கவுள்ளது.

இலங்கையில் பட்டப்படிப்பு ஆராய்ச்சி

இலங்கையரால் பட்டப்பின் படிப்பிற்காக மேற்கொள்ளப்படும் ஆராய்ச்சி ஆக்கங்கள் பற்றிய நூற்பட்டியலொன்றை இலங்கைத் தேசிய நூலகசேவைகள் சபையின் நெறியாளர் திரு. என். அமரசிங்க அவர்கள் திருமதி பத்மா விக்ரமசிங்கவின் உதவியுடன் தயாரித்து வருகிறார்கள்.

இலங்கை நூலகங்களில் வைக்கப்பட்டு உசாத்துணைக்காக உதவப்படும் எல்லா ஆய்வு ஆக்கங்களும் இந்நூற் பட்டியலில் இடம்பெறும்.

A SURVEY OF SCHOOL LIBRARIES

An All Island survey of school libraries has been conducted by the Ceylon National Library Services Board and a report embodying their present conditions, and the measures proposed to improve them is under preparation.

One of the highlights of the survey is that most libraries are managed by personnel without adequante training and professional qualifications.

The report under preparation, has dealt with student population, building facilities, book stocks, library staff. finance, opennig hours, and library education and trainings

The Board expects to submit the report to the Hon. Minister of Education Mr. Ranil Wickramasinghe, shortly.

POSTGRADUATE RESEARCH

A bibliography of Postgraduate Research conducted by Sri Lankan scholars for higher degrees, is under preparation. It will list all Postgraduate dissertatoins deposited in Libraries in Sri Lanka and available for reference.

The bibliography is being compiled by the staff of the Ceylon National Library Services Board and will be published shortly.

පොත් පුවත්

පුවත්පතයි ජනතාවයි

කර්තෘ–

මැක්ෂිමස් රෝයි පෙරේරා

මිළ-රුපියල් 5. 00 යි.

පත්‍ර කලාව හදරන අයටත් ආධුනික ලේඛක ලේඛිකාවන්ටත් මහත් ප්‍රයෝජනවත් විශේෂ උපදෙස් කිහිපයක් මෙම කෘතියේ ඇතුළත්ය.

දේශීය පුවත්පත් ඉතිහාසය හා පැරණි පුවත්පත්හි අදහස් පැවසීමේ ලිවීමේ ශෛලිය, ප්‍රජාතන්ත්‍රවාදී රටක ජන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පුවත්පතට ඇති නිදහස, ප්‍රවෘත්ති ලිවිය යුතු අන්දම, විශේෂ ලිපි ලිවියයුතු ආකාරයද ආදී කරුණු මෙහි සඳහන් වෙයි.

*

සිර කඳවුරට පොත් තැගී

පල්ලෙකැලේ එලිමහන් සිර කඳවුරට රූන්ෆලි පොත් ආධාර ක්‍රමය යටතේ ලැබුණු ග්‍රන්ථ නාම 75 කින් යුත් පොත් කට්ටලයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මහනුවර මධ්‍යස්ථානය මගින් පයුගියදා ලබාදී ඇත.

පුස්තකාල ගොඩනැගිලි සැලසුම්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් සලසන තවත් මහජන සේවාවක්

ඔබේ

මැතිවරණ කෙෂ්ඨයාශයේ නගරයෙහි හෝ ගමේහි **පුස්තකාල සේමියක්** ආරම්භ කිරීමට ඔබ කැමතිද?

එසේනම්

පුස්තකාල සේවා සැලසුම් ගැන අපෙන් විමසන්න.

- මහජන පුස්තකකාල
- පාසල් පුස්තකාල
- ළමා පුස්තකාල
- ප්‍රජාමණ්ඩල පුස්තකාල

විවිධ පුස්තකාල සේවාවට සරිලන පරිදි පුස්තකාල විශේෂඥයන්ගේ උපදෙස් පරිදි ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් නිම්වන ලද මෙම පුස්තකාල ගොඩනැගිලි සැලසුම් සේවය තොම්ලයේ සැපයේ.

පුස්තකාල ප්‍රකාශන දෙකක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් කුඩා පාසල් හා මහජන පුස්තකාල වලට මිලදී ගැනීමට සුදුසු විමර්ශන ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශනයක් හා ඩිවිදශම වර්ගීකරණයෙන් 8 වන සාරාංශයේ නව සංස්කරණයක් පසුගියදා ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත.

සරසවි හැඟුම්

කර්තෘ- ගිරිඋල්ලේ ඇස්. ඒ. පිරිස් ගුණසේකර

සරසවි හැඟුම් තරුණ කවියකු වන ඇස්. ඒ. පිරිස් ගුණසේකරගේ කුළුදුල් පද්‍ය සංග්‍රහයයි. තමා ජීවත්වන පරිසරය උපහාසාත්මකව පෙන්වා දෙමින් හොඳ ආදර්ශයන් මෙන්ම විනෝදය ගෙන දෙන අන්දමේ විවිධ මාතෘකා 50 ක් යටතේ රචිත පද්‍ය රාශියකින් සමන්විත වෙයි. පිටු 67.

අනගාරික ධර්මපාල

කර්තෘ-පූජ්‍ය ගලේගම සරණංකර නාහිමි

මිල-රු. 12. 00 යි.

ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ ජීවන චරිතය විස්තර ඡායාරූප ද සමඟ මෙම කෘතියේ සඳහන් වෙයි.
පිටු 112 කි.

යෝධයාගේ උයන

කර්තෘ පියසේන වික්‍රමගේ

ප්‍රකාශනය–
සීමාසහිත හංස ප්‍රකාශකයෝ

''දේශීය පරිසරය මත ළමා මනසට ගෝචර වන ආකාරයෙන් 'යෝධයාගේ උයන'හි කතා කතුවරයා විසින් ඉදිරිපත් කර ඇත. හොඳ ළමා කෘතියක දැක්ක හැකි අංග රාශියක්ම මෙම ග්‍රන්ථයේ දැකගත හැකිය''.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

- මහජන පුස්තකාල
- විශ්වවිද්‍යාල පුස්තකාල
- පාසල් පුස්තකාල
- විශේෂ පුස්තකාල
- ළමා පුස්තකාල
- සාමාන්‍ය පාඨකයා
- විමර්ශන අවශ්‍යතා
- පර්යේෂණ කටයුතු සඳහා

සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි පොත් පත් තෝරා ගැනීමට මෙරට ප්‍රකාශන පිළිබඳව නිවැරදි තොරතුරු දැක්වෙන ප්‍රධාන ජාතික ප්‍රකාශනය ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය'' දැන් ඔබට ලබාගත හැකිය.

වර්ෂයක දායක මුදල රු. 45. 00)තැ. ගා. සමඟ)

ඔබේ ලියුම්, මුදල් ඇණවුම් හෝ වෙක් පත් පහත ලිපිනයට යොමුකරන්න

අධ්‍යක්ෂක.
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තුන්වන මහල,
මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,
කොළඹ 10.

සිංහප්පූරු දරුවා

(තාන් කොක් සෙං)

පරිවර්තක-සුචරිත ගම්ලත්

මිළ-රුපියල් 20. 00 යි.

සිංගප්පූරු වැසියකු වන තාන් කොක් සෙං විසින් ලියනලද ජීවන කතාවේ පළමු වෙනි කොටස සිංහල බසට පරිවර්තනය කර මෙම ග්‍රන්ථයට ඇතුළත්වී තිබේ.
පිටු 232 කි,

සෙඬළ කුමරිය

කර්තෘ - මහානාම දිසානායක

මිල - රු. 12. 50 යි.

දිවයිනේ ප්‍රවීන පුවත්පත් කලාවේදියකු හා ගත් කතුවරයකු වන මහානාම දිසානායකයන්ගේ අලුත්ම නව කතාව 'සෙඬළ කුමරිය' නමින් එළි දැක ඇත. පිටු 204.

නාරිලතා සහ...

කර්තෘ-ප්‍රාම් දෙල්දෙණියගේ

මිල - රුපියල් 3. 00 යි.

ප්‍රාම් දෙල්දෙණියගේ අලුත්ම කෙටි කතා හා පද්‍ය සංකල්පනා කිහිපයක් මෙම ග්‍රන්ථයට ඇතුළත්වී ඇත.
පිටු 45 කි.

ළමා ලේඛක මාසිකයක්

ළමා ලේඛකයින් වෙනුවෙන් 'ළමා හඬ' නමින් මාසික ප්‍රකාශණයක් නිකුත් කිරීම දැන් ආරම්භකර ඇත. ළමා ක්‍රියාකාරී වීරයෝ ව්‍යාපාරය වෙනුවෙන් කොළඹ 10, මරදන, ඩීන්ස් පාරේ අංක 27, හි ඇ. වීරප්පෙරුම මහතා මෙහි සංස්කාරක වෙයි.
කලාපයක මිල-/25 කි.

අගනුවර ඉදිවෙයි.....

(1 වන පිටුවෙන්)

අත් ලිපි යනාදි වෙනත් මාදිලියේ පාඨක ද්‍රව්‍යයද, ජාතික වශයෙන් වැදගත් තොරතුරු ගැබ්වී ඇති ජන කතා: ජන කවි, මුඛ පරම්පරාගත තොරතුරුද ආරක්ෂාවන පරිදි තැටිගත කිරීම හා ෆිරූපවාහිනි සහ චිත්‍ර පට ගත කිරීම මගින් එකරාශි කර තැබෙන කාර්යාංශද මෙම ජාතික පුස්තකාලයේ පිහිටුවීමටත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසි විධාන යොදා ගෙන යයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් කොළඹ 10, මාළිගාකන්ද පාරේ පිහිටි සමයවර්ධන මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.